 7449

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 14 | |
| 03 | 15 - 22 | |
| 04 | 23 - 30 | |
| 05 | 31 - 41 | |
| 06 | 42 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** "ගීතං වාද්‍යං තථා නෘත්‍යං - ත්‍රයං සංගීතමුච්‍යතේ" වශයෙන් සංගීතය නිර්වචනය කර ඇති මුල්ම කෘතිය තෝරන්න.
(1) නාට්‍යශාස්ත්‍ර (2) බෘහද්දේශී
(3) සංගීතරත්නාකර (4) සංගීතපාරිජාත
(5) චතුර්දණ්ඩිප්‍රකාශිකා (......)

**2.** මේල 72 පිළිබඳ ව හඳුන්වා දුන් සංගීතඥයාගේ නම තෝරන්න.
(1) මාතාංගමුනි (2) රාමාමාත්‍ය (3) භරතමුනි (4) ව්‍යංකටමුඛී (5) ශ්‍රී නිවාස් (......)

**3.** ජයජයවන්ති රාගය පරමේල ප්‍රවේශක රාගයක් ලෙස සැලකීමේ දී ඒ සම්බන්ධයෙන් අදාළ වන ථාට දෙක සඳහන් පිළිතුර තෝරන්න.
(1) ඛමාජ් – භෛරවී (2) ඛමාජ් – කාෆි (3) ඛමාජ් – බිලාවල්
(4) ඛමාජ් – කල්‍යාණ (5) ඛමාජ් – ආසාවරී (......)

**4.** තබ්ලාවේ 'ධිං' අක්ෂරය වාදනය කිරීම සඳහා එක වර උත්පාදනය කරනු ලබන අවනද්ධාක්ෂර දෙක තෝරන්න.
(1) තා සහ ගෙ (2) තිං සහ ක (3) තිං සහ ගෙ
(4) තුං සහ ක (5) තා සහ ක (......)

**5.** ඛාලි ස්ථාන දෙවන සහ සිව්වන මාත්‍රා විභාගයන්හි යෙදෙන තාල යුගලය තෝරන්න.
(1) තීන්තාල් – දීප්චන්දි (2) ඒක්තාල් – චෞතාල්
(3) තිලවාඩා – චෞතාල් (4) ධමාර් – ජප්තාල්
(5) පංජාබි – ඒක්තාල් (......)

[දෙවැනි පිටුව බලන්න.

6. තාම්පුරාව, පඛාවාජය, තබ්ලාව, ස්වර මණ්ඩලය සහ බටනලාව යන සංගීත භාණ්ඩ අතුරෙන් ඛ්‍යාල් ගායනය සමග යොදාගැනීමට වඩාත් යෝග්‍ය භාණ්ඩ යුගලය තෝරන්න.
(1) ස්වර මණ්ඩලය, පඛාවාජය
(2) පඛාවාජය, තාම්පුරාව
(3) තාම්පුරාව, තබ්ලාව
(4) තබ්ලාව, බටනලාව
(5) බටනලාව, ස්වර මණ්ඩලය (……)

7. බාගේශ්‍රී රාගයෙහි පංචම ස්වරය යොදා ගනු ලබන්නේ
(1) අනුවාදී ස්වරයක් ලෙස ය.
(2) අධ්ව දර්ශක ස්වරයක් ලෙස ය.
(3) වාදී ස්වරයක් ලෙස ය.
(4) සංවාදී ස්වරයක් ලෙස ය.
(5) ආගන්තුක ස්වරයක් ලෙස ය. (……)

8. නිර්දේශිත රාගයන්හි යෙදෙන ආරෝහණය සහ අවරෝහණය පිළිබඳව සලකා බැලීමේ දී විකෘති ස්වර එකක් පමණක් ඇතුළත් රාගය තෝරන්න.
(1) භෛරව (2) බාගේශ්‍රී (3) ආසාවරී
(4) ජයජයවන්ති (5) දේස් (……)

9. නිර්දේශිත රාග විස්තරවලට අනුව 'රිමප' සංගතිය **නො යෙදෙන** ආරෝහණය සහිත රාගය තෝරන්න.
(1) දේස් (2) ජයජයවන්ති (3) ආසාවරී
(4) තිලක්කාමෝද් (5) ජෞනපුරි (……)

10. එකම ස්වරය ශුද්ධ සහ කෝමල වශයෙන් යෙදෙන අවස්ථා පෙන්නුම් කරන රාග දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දේස් – ජයජයවන්ති (2) ජයජයවන්ති – ආසාවරී
(3) භෛරව – මාල්කෞන්ස් (4) මාල්කෞන්ස් – ආසාවරී
(5) ආසාවරී – දේස් (……)

11. සන්ධි ප්‍රකාශ සමයට අයත් රාගය තෝරන්න.
(1) ජයජයවන්ති (2) බාගේශ්‍රී (3) භෛරව
(4) මාල්කෞන්ස් (5) තිලක්කාමෝද් (……)

12. නිර්දේශිත රාග විස්තර අනුව කෝමල ධෛවතය වැඩි වශයෙන් ආන්දෝලනය කෙරෙන රාගය වන්නේ,
(1) ආසාවරී ය. (2) මාල්කෞන්ස් ය. (3) කාලිංගඩා ය.
(4) ජෞනපුරි ය. (5) භෛරව ය. (……)

13. අධ්ව දර්ශක (සමය දර්ශක) ස්වරය පදනම් කර ගනිමින් හඳුන්වනු ලබන රාග වර්ගය තෝරන්න.
(1) පූර්වාංගවාදී රාග (2) සන්ධි ප්‍රකාශ රාග
(3) පරමේල ප්‍රවේශක රාග (4) සමප්‍රකෘති රාග
(5) උත්තරාංගවාදී රාග (……)

14. ස්වර පිහිටීම අනුව වඩාත් ම සමානතාවක් පෙන්නුම් කරන භාණ්ඩ යුගලය ඇතුළත් වරණය තෝරන්න.
(1) සිතාර් සහ තාම්පුරා
(2) ගිටාර් සහ සරෝද්
(3) දිල්රුබා සහ එස්රාජ්
(4) සාරංගි සහ වයලින්
(5) සන්තූර් සහ මැන්ඩලින් (……)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අංක **15** සිට **17** දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු තේරීම සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරු කරගන්න.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | මග | රිග | ස | ^මරි | – | ම | ප | (නි) | – | ධ | ප |
| x | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |

**15.** ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන 'මූර්කි' පෙන්නුම් කරන ස්වරය සඳහන් වන්නේ,
(1) පළමු විභාගයෙහි ය. (2) දෙවන විභාගයෙහි ය.
(3) තුන්වන විභාගයෙහි ය. (4) සිව්වන විභාගයෙහි ය.
(5) පස්වන විභාගයෙහි ය. (......)

**16.** 'ඛන්' ස්වරය සහ 'මීන්ඩ්' පෙන්නුම් කෙරෙන විභාග දෙක වන්නේ, පිළිවෙලින්
(1) පළමු විභාගය සහ සිව්වන විභාගයයි.
(2) දෙවන විභාගය සහ තුන්වන විභාගයයි.
(3) තුන්වන විභාගය සහ සිව්වන විභාගයයි.
(4) සිව්වන විභාගය සහ පස්වන විභාගයයි.
(5) තුන්වන විභාගය සහ පස්වන විභාගයයි. (......)

**17.** වක්‍ර ස්වරය ඇතුළත් ස්වර ඛණ්ඩය පෙන්නුම් කෙරෙනුයේ,
(1) පළමු සහ දෙවන විභාග තුළ ය. (2) දෙවන සහ තුන්වන විභාග තුළ ය.
(3) තුන්වන සහ සිව්වන විභාග තුළ ය. (4) සිව්වන සහ පස්වන විභාග තුළ ය.
(5) පස්වන සහ සයවන විභාග තුළ ය. (......)

**18.** සිතාර් වාදනයෙහි ප්‍රවීණ සංගීතඥයින්ගේ නම් පමණක් සඳහන් වන වරණය තෝරන්න.
(1) රවි ශංකර්, නිඛිල් බැනර්ජි, විලායත් ඛාන්
(2) විලායත් ඛාන්, සුල්තාන් ඛාන්, අලි අක්බර් ඛාන්
(3) අලි අක්බර් ඛාන්, අසීස් චන්ද්‍ර බැනර්ජි, රවි ශංකර්
(4) රවි ශංකර්, රාම් නාරායන්, ශිවකුමාර් ශර්මා
(5) ශිවකුමාර් ශර්මා, නිඛිල් බැනර්ජි, විලායත් ඛාන් (......)

**19.** ශාස්ත්‍රීය තබ්ලා වාදනයක් සඳහා සහාය වාදනය ලෙස වැයෙන ස්වර ප්‍රබන්ධය හැඳින්වෙන්නේ,
(1) උපජ් නමිනි. (2) ලෙහෙරා නමිනි. (3) සූත් නමිනි.
(4) ජෝඩ් නමිනි. (5) ගත් නමිනි. (......)

**20.** හින්දුස්තානි සංගීත වාද්‍ය භාණ්ඩ පිළිබඳව නිවැරදි ප්‍රකාශය සඳහන් වරණය තෝරන්න.
(1) දිල්රුබාව අනුනාද රහිත වාද්‍ය භාණ්ඩයකි.
(2) සිතාරය 'ජවා' නම් උපකරණයෙන් වයනු ලබන වාද්‍ය භාණ්ඩයකි.
(3) සන්තූරය සුෂිර වාද්‍ය භාණ්ඩයකි.
(4) සරෝද් පර්දා සහිත තත් වාද්‍ය භාණ්ඩයකි.
(5) පඛාවාජය උත්තර භාරතීය සංගීත පද්ධතියට අයත් වාද්‍ය භාණ්ඩයකි. (......)

**21.** නවග්‍රහයින් උදෙසා පවත්වනු ලබන ශාන්තිකර්මය තෝරන්න.
(1) දෙවොල්මඩු (2) මහසොහොන් සමයම (3) දිය කොරහෙබලි
(4) ගම්මඩු (5) සූනියම් යාගය (......)

**22.** "සුරිඳුන් පෙර සිටන් - බල යුත් සැවතිදුන්"
මේ ගී පාදයේ යෙදෙන සඳැස්මත් හා ගීමත් ගණන වනුයේ පිළිවෙලින්,
(1) සඳැස්මත් 10 ක් සහ ගීමත් 10 ක් වේ. (2) සඳැස්මත් 12 ක් සහ ගීමත් 12 ක් වේ.
(3) සඳැස්මත් 16 ක් සහ ගීමත් 20 ක් වේ. (4) සඳැස්මත් 18 ක් සහ ගීමත් 24 ක් වේ.
(5) සඳැස්මත් 18 ක් සහ ගීමත් 24 ක් වේ. (......)

**23.** බඹර ගී, පතල් ගී, වැදි නැළවිලි ගී යන ගී වර්ග තුනට ම අදාළ වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සියලුම ගී වර්ග මෙහෙ ගී ගණයට අයත් වේ.
(2) සියලුම ගී වර්ග සමාජ ගී ගණයට අයත් වේ.
(3) සියලුම ගී වර්ග ඒකල ව ගායනය කෙරේ.
(4) සියලුම ගී වර්ග සාමූහික ව ගායනය කෙරේ.
(5) සියලුම ගී වර්ග අනාඝාතාත්මක ව ගායනය කෙරේ. (……)

**24.** සේ ගී ගණයට අයත් වන ගී වර්ග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ප්‍රශස්ති - ශාන්තිකර්ම - වැළපුම් ගී
(2) වැළපුම් ගී - වන්නම් - ශාන්තිකර්ම
(3) ශාන්තිකර්ම - ප්‍රශස්ති - හටන්
(4) හටන් - වන්නම් - වැළපුම් ගී
(5) වැළපුම් ගී - ප්‍රශස්ති - ටීකා සී පද (……)

**25.** ශ්‍රී ලංකාවේ ප්‍රථම නාඩගම ලෙස සැලකෙන "හරිශ්චන්ද්‍ර" නාඩගම සඳහා දායක වූ සංගීතඥයා තෝරන්න.
(1) ගණිතාලංකාර
(2) අලගනායිදු
(3) නාරසිංහ
(4) නාරායන් අයියර්
(5) විශ්වනාත් ලෞජි (……)

**26.** නූර්ති ගීතය සහ ඊට අදාළ නූර්තියෙහි නම නිවැරදි ව සඳහන්ව ඇති වරණය තෝරන්න.
(1) හෘදේ මගේ ශෝක බෝ වේ - දුටුගැමුණු
(2) බන්දා මා දේදො පියාණෝ - වෙස්සන්තර
(3) මීරිනාද කෝකිලාදි පක්ෂියන් - ශ්‍රී වික්‍රම
(4) මෝක්ෂාචාර්ය තිලෝනාගේ - පද්මාවතී
(5) වාසනා දිනේකි මේක - රාමායණය (……)

**27.** ටියුබා (Tuba) සහ හාප් (Harp) යන සංගීත භාණ්ඩ දෙක අයත් වන වර්ගීකරණ දෙක පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
(1) Bowing - Plucking
(2) Brass wind - Definite pitch
(3) Woodwind - Indefinite pitch
(4) Brass wind - Plucking
(5) Woodwind - Plucking (……)

**28.** | + +ස –රිගම | යන පෙරදිග ස්වර ප්‍රස්තාරයේ විභාගය, බටහිර ස්වර ප්‍රස්තාර ක්‍රමයට ලිවීමේ දී අවශ්‍ය වන ස්වරවල වටිනාකම් පෙන්නුම් කෙරෙන සංකේත නාමය අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) Dotted Quaver Rest, Dotted Semi Quaver සහ Quaver
(2) Dotted minim Rest, Dotted Quaver සහ Demi Semi Quaver
(3) Dotted Croctchet Rest, Dotted Quaver සහ Semi Quaver
(4) Dotted Quaver Rest, Dotted Semi Quaver සහ Semi Quaver
(5) Dotted Croctchet Rest, Dotted Quaver සහ Demi Semi Quaver (……)

**29.** CEG# යන ස්වර සංකලනය වී නිර්මාණය වන ස්වර සංඝාතය හැඳින්වෙන නාමය තෝරන්න.
(1) C Major
(2) C Minor
(3) C Augmented
(4) C Diminished
(5) C Suspended 4 (……)

**30.** හොවාර්ඩ් ගාඩ්නර් නමැති මනෝවිද්‍යාඥයා පෙන්වා දී ඇති බහුවිධ බුද්ධිය යන සංකල්පය යටතට **නො ගැනෙන**, බුද්ධි ප්‍රභේදය වනුයේ,
(1) වාචසික – භාෂාමය බුද්ධිය ය.
(2) සංගීත – රිද්මයානුකූල බුද්ධිය ය.
(3) මානසික – නිර්මාණාත්මක බුද්ධිය ය.
(4) දෘශ්‍ය – අවකාශමය බුද්ධිය ය.
(5) පුද්ගල – ඇතුළාන්ත බුද්ධිය ය. (……)

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

● අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**31.** 'ස්වරමේල කලානිධි' නම් කර්ණාටක සංගීත ග්‍රන්ථය ............................ විසින් රචනා කරන ලද අතර, 'ක්‍රමික් පුස්තක් මාලිකා' නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ ............................ විසිනි.

**32.** සිංහල බසින් රචිත 'භාවික ගීත' ග්‍රන්ථය ............................ විසින් රචනා කරන ලද අතර 'විශ්ව සංගීත ක්ෂේත්‍ර' නමැති ග්‍රන්ථය රචනා කරන ලද්දේ ............................ විසිනි.

**33.** ............................ නමැති වාද්‍ය භාණ්ඩය වාදනයෙහි ප්‍රවීණ සංගීත ශිල්පියෙකු ලෙස ශිවකුමාර් ශර්මා හැඳින්විය හැකි අතර බිස්මිල්ලා ඛාන් ........................ නමැති වාද්‍ය භාණ්ඩ වාදනයෙහි ප්‍රවීණයෙකු ලෙස සුප්‍රසිද්ධ ය.

**34.** උත්තර භාරතීය රාගධාරී ශාස්ත්‍රීය සංගීතයෙහි භාවිතයේ පවතින අළුවෙන් (Bow) වැයෙන පර්දා රහිත භාණ්ඩ දෙකක් ලෙස ............................ සහ ............................ හැඳින්විය හැකි ය.

**35.** මසීද්ඛානි සහ ............................ නමින් හඳුන්වනු ලබන ගත් වාදන ශෛලීන් දෙක සිතාරයෙන් වයනු ලබන අතර, එම භාණ්ඩයෙන් වයනු ලබන ............................ , තෝඩා යන නමින් ද හඳුන්වනු ලබයි.

**36.** නිර්දේශිත රාග දෙකක් වන ............................ රාගයෙන් සහ ............................ රාගයෙන් ඛ්‍යාල් ගායනය සිදුකිරීමේ දී තාම්පුරාවෙහි තත් හතර, ම̣ ස ස ස̣ ලෙස සුසර කරනු ලැබේ.

**37.** ත්‍රිතාල්, ............................ සහ ............................ යන තාල තුන මිතියෙන් සමාන නමුත් ගතියෙන් වෙනස් වේ.

**38.** පඛාවාජය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වශයෙන් යොදා ගැනෙන ගායන ශෛලීන් ලෙස චතුරංග, ........................ සහ .................... හැඳින්විය හැකි ය.

● අංක **39** සිට **41** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා පහත ඡේදය අදාළ කරගන්න.

"ඒකල ශාස්ත්‍රීය වාදනයක් මුඛඩාවෙන් ආරම්භ කරමින්, ගත් වාදනයෙහි යෙදුනු තාරක විසින් තිහායි කොටසින් සිය වාදනය අවසන් කරන ලදී. ගයනී විසින් එම වාදනයේ මුල සිට අවසානය දක්වා සාරංගියෙන්, |ගුම ධනි සං – – නි ධ ම ගුම ගුස| වශයෙන් වූ ස්වර රචනාව නැවත නැවත වාදනය කරන ලදී."

**39.** තාරක විසින් ............................ නම් වාද්‍ය භාණ්ඩය වයන ලද අතර ඔහුගේ වාදනය සිදු කරන ලද්දේ නිර්දේශිත තාලයක් වන ............................ තාලය අනුව ය.

**40.** ගයනී විසින් වයන ලද ස්වර රචනාවෙහි ශුද්ධ නිෂාද ස්වරය වෙනුවට කෝමල නිෂාදය යෙදූවිට ............................ නම් රාගය පිළිඹිබු වේ. එම ස්වර රචනාව අනුව සමග්‍රහය පෙන්නුම් කිරීම සඳහා වඩාත් ම සුදුසු ස්වරය වන්නේ ............................ ස්වරයයි.

**41.** හින්දුස්තානි සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත ඡේදයෙහි සඳහන් තාරක විසින් වැයූ භාණ්ඩය ........................ වාද්‍ය සණයට ද සාරංගී භාණ්ඩය ........................ වාද්‍ය සණයට ද අයත් වේ.



Past Papers Wiki

42. $\overset{\wedge}{|1\ 2}\quad \overset{/}{|1\ 2\ 3\ 4}\ \overset{\wedge}{|1\ 2}\quad \overset{/}{|1\ 2\ 3\ 4}\ |$ මෙම තිත් රූපය ............................ දෙතිතට අයත් වන අතර, | ජි ං | ජි මි ත | ත ත් | ත ක ට | යන බෙරපදය වාදනය කිරීමට සාම්ප්‍රදායික ව භාවිත කරනු ලබන්නේ ......................... නම් අවනද්ධ භාණ්ඩයයි.

43. "කපන කොටන බිම පෙරළන" වශයෙන් ආරම්භ වන හටන් ගීතය ................. තිත අනුව ගැයෙන අතර, "ලක්ෂ්මී බුජවාසා" සහ ......................... වශයෙන් පද යෙදෙන ගීත මුද්‍රප්පදය සහිත නිර්දේශිත ප්‍රශස්ති ගීත වේ.

44. ගණපති සවුදමේ ඇතුළත් | තත් ජිත් තොන් නන් | අකු ලාඟ ගෙන සොඬ | වශයෙන් යෙදෙන බෙරපද හා පද කොටස් ................. තනි තිතට අනුව ශිල්පියා විසින් උච්චාරණය කළ පසු, එය වාදනය කර පෙන්වනුයේ ................. නම් අවනද්ධ වාද්‍ය භාණ්ඩයෙනි.

45. ''සිරිනි සරුසර වීලා'' ගීතය ............................... චිත්‍රපටයට අයත් වන අතර එහි සංගීත අධ්‍යක්ෂණය කර ඇත්තේ ............................... විසිනි.

46. මෙරට කණ්ඩායම් සංගීතය හා සම්බන්ධයෙන් විමසා බලන විට "නැළවෙන මව් උකුළේ" ගීතය ................. නමැති සංගීත කණ්ඩායම විසින් ද, "මුළු ගතම වෙහෙසුනා" ගීතය ............................ නමැති සංගීත කණ්ඩායම විසින් ද ඉදිරිපත් කර ඇත.

47. වියෝලා වාද්‍ය භාණ්ඩය අපරදිග සංගීතයේ .................................. හඬ තලයට අයත් වන අතර එම තන්ත්‍රිය භාණ්ඩ වර්ගීකරණය (String Family) අනුව .................................. වාද්‍ය භාණ්ඩය බේස් (Bass) හඬ තලයට අයත් වේ.

48. ලෝකයෙහි භාවිත වන විවිධ සංගීත පද්ධති පහක් හඳුනාගෙන ඇත. එනම් භාරතීය, අපරදිග, .............. , ඉස්ලාමීය සහ .............. වශයෙනි.

49. අපරදිග කැන්ටාටා සංගීතාංගයේ ආරම්භය සහ වර්ධනය යන කාරණා දෙකම සිදු වී ඇත්තේ යුරෝපා මහාද්වීපයට අයත් රටවල් දෙකක් වන ............................ දී සහ ............................ දී ය.

50. සංධ්වනි ආකෘතිය හෝ සමූහ වාදන ආකෘතිය අනුගමනය කරමින් සංගීතඥ ලයනල් එදිරිසිංහයන් විසින් ............................ නමින් නිර්මාණයක් සිදු කර ඇති අතර ''මගේ කාලයේ මව්නි'' යන තේමාවෙන් සමූහ වාදනයක් නිර්මාණය කරන ලද්දේ ............................ නමැති සංගීතඥයා විසිනි.

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

පෙරදිග සංගීතය II
கீழைத்தேய சங்கீதம் II
Oriental Music II

54 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✻ I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් පූර්වාංගයේ යෙදෙන ස්වර සංගති කිහිපයකි.

A- ම ග රි ගු රි නි̣ ස
B - ග ම රි රි ස ග ම
C - ස ගු ම ම ගු රි ස
D - ස රි ප ම ග ස නි̣

(i) ඉහත ස්වර සංගතීන් අයත් වන රාග හඳුනාගෙන, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත A, B සහ C හි ඇතුළත් සංගති මගින් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) හංසධ්වනි රාගයට අදාළ පහත සඳහන් තානාලංකාර හතර අයත් වන තාන වර්ග හතර, වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අදාළ අංක ද සමග ලියන්න.

(අලංකාරික තාන, බෝල් තාන, ශුද්ධ තාන, මිශ්‍ර තාන, කූට තාන)

(1) ගරි ගප රිග නිප ගස රිග නි̣ස ප̣ස
(2) ගප නිස̇ රි̇ග̇ ප̇ග̇ රි̇ස̇ නිප ගරි ස–
(3) ගග රිග පප ගප නිනි පනි ස̇ස̇ නිස̇
(4) සරි ගප රිග පනි ගප ස̇නි පග රිස

(ලකුණු 04 යි.)

(iv) නිර්දේශිත රාග විස්තර අනුව, දේස් සහ ජයජයවන්ති රාග දෙකෙහි සමානතා **දෙකක්** සහ අසමානතා **හතරක්** ලියන්න. (ලකුණු 06 යි.)

**2.** (i) පහත දී ඇති එක් එක් ලක්ෂණය මගින් පිළිබිඹු වන රාගවල නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න.

A - ධ̣ ප ග ම ග, නි̣ ස රි ග ම වශයෙන් මුඛ්‍යාංගය යෙදෙන රාගයක් වේ.

B - භෛරවී මේලගත ඖඩව ජාතියට අයත් රාගයක් වේ.

C - ආරෝහණයේ 'ග' සහ 'ධ' ස්වර දුර්වලව යෙදෙන, අවරෝහණයේ රිෂභය වක්‍රවන රාගයක් වේ.

D - ආසාවරී ථාටයට අයත් ෂාඩව-සම්පූර්ණ ජාති රාගයක් වේ. (ලකුණු 04 යි.)

(ii) දේස්, හංසධ්වනි, ආසාවරී යන රාග අතුරෙන් කැමති රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(iii) නිර්දේශිත රාග අතුරෙන් ඛමාජ් ථාටයට අයත් සමප්‍රකෘති රාග යුගලය නම් කර, එම රාග දෙකෙහි අසමානතා **දෙකක්** රාග සංගති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) පහත සඳහන් ස්වර ප්‍රස්තාරය නිර්දේශිත රාග පහක් ආශ්‍රයෙන් නිර්මාණය කර ඇත.

| ① | ② | ③ | ④ |
|---|---|---|---|
| රි ම ප සං | ධ – ධ ප | මග ම රි ස | ම ධ නි ධ |
| ⑤ | ⑥ | ⑦ | ⑧ |
| සං – නි ධ | ප මග රිග ස | පනි සරි ගරි සරි | ගරි ගප නිප නිසං |

ඉහත එක් එක් විභාගයට යොදා ඇති අංක ආශ්‍රයෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A ① සහ ② විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
B ② සහ ③ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
C ④ සහ ⑤ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
D ⑤ සහ ⑥ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න.
E ⑦ සහ ⑧ විභාග බද්ධ වීමෙන් පිළිබිඹුවන රාගය නම් කරන්න. (ලකුණු 05 යි.)

**3.** (i) ඒක්තාල්, තිලවාඩා, ධමාර්, පංජාබි, චෞතාල්, ජප්තාල් සහ දීප්චන්දි යන තාල අතුරෙන් පහත සඳහන් මාත්‍රා සංඛ්‍යාවන්ගෙන් යුක්ත තාල **දෙක** බැගින් නම් කරන්න.

(1) මාත්‍රා 14 (2) මාත්‍රා 12 (3) මාත්‍රා 16 (ලකුණු 03 යි.)

(ii) ඉහත තාල අතුරෙන් මාත්‍රා 14 කින් යුත් තාලයක ඒකාව, සමගුණ සහ දෙගුණ වශයෙන් තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි.)

(iii) පහත දක්වා ඇති එක් එක් ගායන ශෛලීන් සඳහා වඩාත් ගැළපෙන කරුණු වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියා දක්වන්න.

(විලම්බලය ඒක්තාල්, ජග්ජීත් සිං, කබීර් දාස්, හෝරි, අමීර් ඛුෂ්රු, අනුපල්ලවි, චෞතාල්)

(A) ධ්‍රැපද් (B) ඛ්‍යාල් (C) භජන්
(D) ධමාර් (E) ගසල් (F) තරාණා (ලකුණු 06 යි.)

(iv) පහත කරුණු තුනක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) ගානසමය (2) ආලාප (3) තිහායි (4) වාදි-සංවාදි (ලකුණු 06 යි.)

## II කොටස

**4.** (i) සැවුලා වන්නම අයත් වන තාල රූපයේ මාත්‍රා විභාග වන ආකාරය අංක වශයෙන් ප්‍රස්තාර කර, එම තාල රූපයේ විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) නිර්දේශිත 'වරම්' ගීතයක සහ 'ඕසය සහිත නෙළුම්' ගීතයක මුල් ගී පාදය බැගින් වෙන වෙන ම ලියා, එම එක් ගී වර්ගයක් පිළිබඳ ව පහත කරුණු යටතෙහි නිදසුන් සහිතව විස්තර කරන්න.

- නාද රටා
- රිද්මය
- භාෂාව (ලකුණු 08 යි.)

(iii) මෙරට සංගීතය පෝෂණය වීම සඳහා මහනුවර යුගයේ දී කර්ණාටක සංගීතයෙන් සිදු වූ බලපෑම වන්නම් සහ ප්‍රශස්ති ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**5.** (i) නාඩගම් සංගීතයේ ඇතුළත් තෝඩායම සහ ඉන්නිසය යන අංග උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(ii) නාඩගම් සඳහා ලබා ඇති කර්ණාටක සංගීත ආභාසය පිළිබඳව කරුණු **හතරක්** යටතෙහි නිදර්ශනාත්මක ව පෙන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(iii) නිර්දේශිත නුර්ති ගීතයක් තෝරාගෙන, එම ගීතයේ ස්ථායි කොටස ගී පද ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

(iv) සොකරි සහ කෝලම් රංග ශෛලීන් දෙකෙහි සමානතා **හතරක්** සහ අසමානතා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

## III කොටස

**6.** (i) පහත සඳහන් C minor ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරය F minor ස්කේලයට අනුව ප්‍රස්තාර කරන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පධු | නි | ස්නි | ධු | ප | - | මගු | ම | රි | ගු | ප | - |
| ධු | - | පම | ප | ම | ගු | ම | ගු | රි | ස | - | - |

(ලකුණු 04 යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන, කෙටියෙන් විස්තර කරන්න.

- බැලේ
- සොනාටා
- කැන්ටාටා
- සිම්ෆනි

(ලකුණු 04 යි.)

(iii) පහත ගී පද ප්‍රස්තාරයට යොදා ඇති ස්වර සංඝාතවලට (Chords) අනුකූල වන ලෙස පද මාලාවට උචිත තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කරන්න.


Ⓒ Ⓕ Ⓒ Ⓖ
| පෙ ති සැ | ලී S වි සි | රැ ණු කු | සු ම් සේ S |

Ⓖ — Ⓖ7 Ⓒ
| දි ලෙ ති | අ හ සේ S | තා S ර | කා S වෝ S |

(ලකුණු 08 යි.)

(iv) පහත A **හෝ** B හෝ යන **එක්** කොටසක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(A) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න.



(එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 කට ලකුණු 04 යි.)

**හෝ**

(B) පහත දැක්වෙන පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබට සපයා ඇති සංගීතය පිළිබඳ අත් පිටපත (Music Manuscript) යොදා ගත හැක.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | ගප | ස් | ග් | - | -රි | නිස් | ධනි | ප | ම | -ග |
| ග | - | රිස | ප | - | ස්නි | ධනි | පධ | මග | + | රිග | ස |

(එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 කට ලකුණු 04 යි.)

**7.** (i) සරත් දසනායක සහ ප්‍රේමසිරි කේමදාස යන සංගීතඥයින්ගෙන් එක් සංගීතඥයෙකු විසින් නිර්මාණය කරන ලද නිර්දේශිත චිත්‍රපට ගීතයක් තෝරාගෙන, පහත ශීර්ෂ ඔස්සේ නිදර්ශනාත්මකව ඇගයීමක් කරන්න.

- තේමාවට ගැළපෙන ලෙස සංගීත සංයෝජනය
- පද මාලාවට උචිත තනු නිර්මාණය (ලකුණු 06 යි.)

(ii) දේශීය චිත්‍රපට සංගීතය සඳහා කණ්ඩායම් සංගීතයේ දායකත්වය ලැබූ චිත්‍රපට **දෙකක්** සහ ඊට අදාළ ගීත **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) ස්වතන්ත්‍ර සංගීත නිර්මාණ ඇතුළත් නිර්දේශිත සිංහල චිත්‍රපට **තුනක** නම් සඳහන් කර එම චිත්‍රපට තුනට අයත් ගීත **තුනක්** වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 06 යි.)

(iv) සරල ගීතයක් ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේ නව ප්‍රවණතා පිළිබඳ කරුණු **හතරක්** යටතේ අදහස් දක්වන්න. (ලකුණු 04 යි.)

**8.** පහත සඳහන් කොටස් අතුරෙන් **හතරක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) උතුරු ඉන්දීය සංගීතයේ දියුණුව සඳහා පහත එක් සංගීතඥයකුගෙන් සිදු වූ සේවය නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) අමීර්ඛුස්රු

(b) භාත්කණ්ඩේ

(ii) ලයනල් එදිරිසිංහ සූරීන්ගෙන් සංගීත අධ්‍යාපනයට සිදු වූ සේවාව කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඩබ්ලිව්. බී. මකුලොලුව සූරීන් විසින් රචිත 'හෙළ ගී මග' ග්‍රන්ථය පාසල් සංගීත අධ්‍යාපනයට දායක වී ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iv) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය හඳුන්වා, එහි Wind Instruments කොටස පිළිබඳ නිදසුන් සහිතව විස්තර කරන්න.

(v) තබ්ලා වාදනයක ඇතුළත් කායදා සහ පල්ටා යන අංග දෙක විස්තර කර, ත්‍රිතාලයට අදාළ වන සේ කායදාවක් සහ පල්ටාවක් තාලානුකූලව ලියා දක්වන්න.

(ලකුණු 05 × 4 = ලකුණු 20 යි.)

***

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



# LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK